**බද්දේගම ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**-------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 පෙබරවාරි 24 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට බද්දේගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.2,491,756 ක් වූ පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් සම්බන්ධයෙන් ණයහිමි ප්‍රතිපාදන ඇතිකර නොතිබුණි.

(ආ) දේශීය ආදායම් කොමසාරිස්ට ගෙවිය යුතු රු.329,698 ක බදු මුදල් ද, රු.86,632 ක් වූ ගෙවල් කුලී තැන්පතු ද නිරවුල් කිරීමට කටයුතු නොකර, සමුච්චිත අරමුදල් ගිණුමට බැර කිරීමෙන් ගිණුම් පියවා තිබුණි.

(ඇ) පැරණි ඉරිදා පොළ ඉදිරිපිට අළුත් කඩකාමර අංක 02 න් අයවිය යුතු රු.125,000ක එක්වන් මුදල් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) 1992 වසරේ මිලට ගත් රු.312,500 ක් වූ කෘ කැබ් රථයක වටිනාකම 2013 වසරින් පසු ගිණුම්වලින් අත්හැරී තිබුණි.

#### 1.3.2 නොසැසඳුණු ගිණුම්
**---------------------**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.105,881,010 ක් වූ ගිණුම් විෂයයන් 12 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර වෙනසකම් දක්නට ලැබුණු අතර, නිරීක්ෂණය වූ අසමානතා වල එකතුව රු.61,970,921 ක් විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(අ) ලැබිය යුතු ගිණුම්**

දීර්ඝ කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.14,991,055 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 09 ක් හා 2015 වර්ෂයේ සිට පැවත එන කර්මාන්ත දෙකකට අදාළ රු.380,198 ක ශේෂයක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

2017 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමි ශේෂය තුළ වූ 2015 වර්ෂයේ සිට පැවත එන රු.409,673 ක් වූ ණයහිමි ශේෂ 02 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.151,011,448 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| **(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති** | |
| (i) රීති 33 | වරිපනම් බදු ලිපිකරු විසින් එක් එක් කාර්තුවක් අවසානයේ වරිපනම් බදු ගෙවීම පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තුව සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. |
| (ii) රීති 145 | ආපසු ගෙවිය යුතු තැන්පත් පිළිබඳ විස්තරාත්මක ප්‍රකාශයන් සකස් කර, ලෙජරයේ දැක්වෙන ශේෂය සමඟ ගැලපීම් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iii) | රීති 164 | සභාවේ ගිණුම් ලියවිලි ලේකම්වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ දිනපතා පරීක්ෂා කළයුතු අතර, සිය කෙටි අත්සන යෙදීමෙන් එහි අන්තර්ගත සටහන් නිවැරදි බවට සහතික කර නොතිබුණි. |
| (iv) | රීති 217 | අංක පී.එස්.46 දරන ආකෘතිය ප්‍රකාරව ලේඛනයක් ද පවත්වා නොතිබුණි. |
| (v) | රීති 218 | සභාව සතු සියලුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් කර නොතිබුණි. |

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි**

----------------------

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 570 හා 571(1)(2) | 2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ක කාලයක් ඉක්ම වූ වර්ෂ 04 කට අදාළ එකතුව රු.4,105,420 ක තැන්පතු ශේෂයන් ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 702(3) | කොන්ත්‍රාත් සම්බන්ධව අත්සන් කරනු ලබන ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 1645 හා 1646 | සභාවට අයත් ධාවන තත්ත්වයේ පවතින වාහන 04 කට අදාළ දෛනික ධාවන සටහන්පත් හා මාසික කාර්යසාධන සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය | සභාව සතුව පැවති පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.21,358,068 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.18,235,414 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

සභාවේ පවත්වාගෙන යන ජංගම ගිණුම් දෙකක රු.15,655,152 ක සාමාන්‍ය ශේෂයක් පැවති අතර, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 171 හා 184 වගන්ති ප්‍රකාරව අතිරික්තව ඇති මුදල් ආයෝජනය කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් සභාවට උපයාගත හැකිව තිබූ පොලී ආදායමක් අහිමි වී තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,755,436 | 3,039,858 | 1,101,939 | 1,937,268 | 2,765,676 | 3,053,829 | 857,360 | 2,196,469 |
| කුලී | 1,179,100 | 1,975,610 | 1,862,635 | 112,975 | 1,028,100 | 1,111,500 | 1,048,425 | 63,075 |
| බලපත්‍ර ගාස්තු | 1,204,000 | 1,279,600 | 1,273,760 | 6,000 | 1,025,750 | 1,132,475 | 1,132,475 | - |
| | 5,138,536 | 6,295,068 | 4,238,334 | 2,056,243 | 4,819,526 | 5,297,804 | 3,038,260 | 2,259,544 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත මුළු ආදායම රු.5,138,536 ක් වූ අතර, බිල්කල ආදායම රු.6,295,068 ක් විය. රු.2,259,544 ක් වූ ආරම්භක හිඟය සමඟ අයවිය යුතු මුළු මුදල රු.8,554,612 ක් වුවද, වර්ෂය තුළ රැස් කළ ආදායම රු.4,238,334 ක් වීමෙන් වර්ෂය අවසානයට මුළු හිඟ ආදායම රු.2,056,243 ක් විය.

### 2.3.3 වරිපනම් හා බදු

ආරම්භක හිඟ ශේෂය රු.2,196,469 ක් වූ අතර, රු.3,039,858 ක් වූ වර්ෂයේ බිල් කිරීම් සමඟ රු.5,236,327 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.1,101,939 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.1,937,268 ක හිඟ ශේෂයක් විය. මෙ අනුව වරිපනම් හා බදු අයකිරීමේ දුර්වල තත්ත්වයක් පවතින බව නිරීක්ෂණය විය.

**2.3.4 කුලී**

**-----**

ඇස්තමේන්තුගත වටිනාකමට වඩා රු.796,510 ක වටිනාකමින් වැඩිපුර බිල්කිරීම් පැවති අතර, ආරම්භක හිඟ ශේෂය රු.63,075 ක් වූ අතර, රු.1,975,600 ක් වූ බිල්කිරීම් සමඟ රු.2,038,685 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.1,862,635 ක් වීම නිසා වර්ෂය අවසානයට හිඟ ශේෂය රු.112,975 ක් විය.

**2.3.5 බලපත්‍ර ගාස්තු**

**---------------**

ඇස්තමේන්තුවේ අගයට වඩා රු.75,000 ක් සභාවේ බිල් කිරීම් ඉහළ අගයක් ගත් අතර, රැස්කිරීම් රු.1,279,000 ක් වීමෙන් අයකිරීම් ප්‍රතිශතය 99% ක් ව පැවතුණි.

**2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

------------------------------

දකුණු පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.4,027,067 ක් හා මුද්දර ගාස්තු රු.40,583,533 ක් විය.

**2.4 අධිභාර**

--------

ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂයන් තුළ පැන වූ අධිභාරයන් 03 කට අදාළව 2017 දෙසැම්බර් 31 දිනට රු.2,452,544 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**3.1 කාර්යයසාධනය**

**------------------**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

--------------------

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**(ආ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**

**----------------------------------------**

(i) **ව්‍යාපෘති ප්‍රමාද කිරීම**

----------------------

2017 වසරේ දකුණු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ වෙන් කළ රු.343,975 ක මුදල 2018 මාර්තු වන විටත් අදාළ කාර්යයට යොදාගෙන නොතිබුණි.

(ii) 2017 වර්ෂයේ සංවර්ධන සැලැස්ම යටතේ දකුණු පළාත් සභා මන්ත්‍රීවරු හතර දෙනෙකුගෙන්, 2017 සැප්තැම්බර් 17 දින සභාවට ලැබී තිබුණු එකතුව රු.345,000 ක් අපේක්ෂිත කාර්යයන්හි උපයෝජනය කර නොතිබුණි.

**(ඈ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

සභාව විසින් පිළිසරු ව්‍යාපෘතියේ ආධාර ඇතිව 2015 වර්ෂයේ දී රු.1,243,062 ක් වියදම් කර කසළ කළමනාකරණ මධ්‍යස්ථානයක් ආරම්භ කර තිබුණ නමුත්, ඒ සඳහා පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.

2017 වර්ෂයේ දී කොම්පෝස්ට් පොහොර අලෙවියෙන් රු.89,220 ක ආදායමක් උපයා තිබූ අතර, කසළ කළමනාකරණ වියදම රු.5,480,090 ක් විය.

ප්‍රාදේශීය සභා පනතේ 93, 94 හා 95 වගන්ති ප්‍රකාරව කසළ බැහැර කරන බවට වගබලා ගැනීමට අවශ්‍ය සියලුම වැඩපිළිවෙලවල් සහ පූර්වාරක්ෂක විධිවිධාන ප්‍රාදේශීය සභාව සලසා ගතයුතු වුවත්, සභාව විසින් ඒ පරිදි කටයුතු කර නොතිබුණි.

**(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක**

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

**(ඉ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

වඳුරඹ ආදාහනාගාරය ඉදිකිරීමේ කර්තව්‍යය ඉටු කිරීම සඳහා රු.1,850,000 ක මුදලක් වැයකර තිබුණ ද, අපේක්ෂිත නිමවුම් මට්ටම **(out put)** අත්පත් කරගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| **කර්තව්‍ය** | **ඇස්තමේන්තු මුදල** | **ඉටුකල ප්‍රමාණයේ වටිනාකම** | **නිරීක්ෂණ** |
|---|---|---|---|
| | රු. | රු. | |
| වඳුරඹ ආදාහනාගාරය ඉදිකිරීම | 4,500,000 | 1,850,000 | 2017.11.15 දින ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ලේන්වල වත්ත පන්සල කොටස ඉඩම මිලදී ගැනීම හැර වෙනත් කටයුතු කිසිවක් සිදුකර නොතිබුණි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**-------------------------------------**

**වීථි පහන් නඩත්තුව**

-----------------------

2010 අගෝස්තු 17 දිනැති අංක පීඊ/01/01 දරන විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර, වීථි පහන් නඩත්තුව සඳහා වර්ෂය තුළ රු.718,355 ක් වැය කර තිබුණු නමුත්, ඒ සඳහා ප්‍රතිපූර්ණයන් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

(අ) (i) සේවක සංඛ්‍යා සැලැස්ම අනුව අතිරික්ත සේවක සංඛ්‍යාව 11 ක් වූ අතර, පුරප්පාඩු සංඛ්‍යාව 02 ක් විය.

(ii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 ට අනුකූල නොවන පරිදි බඳවා ගත් ආදේශක සේවකයින් 11 දෙනෙකුට වැටුප් හා දීමනා ගෙවීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී සභා අරමුදලින් රු.3,239,253 ක් වැයකර තිබුණ අතර, කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවිකාවකට 2017 වර්ෂය තුළ රු.148,500 ක් ගෙවා තිබුණි.

(ආ) කාර්යාල කාර්ය සහායකවරයෙකුට ප්‍රසම්පාදන කටයුතු හා ගෙවීම් කටයුතු ද පවරා තිබුණි.

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) බද්දේගම ප්‍රාදේශීය සභාවේ තෙලිකඩ මාපුවාන උප කාර්යාලයට අයත් කඩ කාමර 05 න් කඩ කාමර 03 ක් අබලන්ව පැවති අතර, කඩ කාමර 02 ක් මසකට රු.125 බැගින් බදු දී තිබුණි. සභාව සතු මෙම කඩ කාමර අළුත්වැඩියා නොකිරීම නිසා උපයා ගත හැකිව තිබූ ආදායම උපයාගත නොහැකි වී තිබුණි.

(ආ) බද්දේගම ප්‍රාදේශීය සභාවට අයත් පැරණි ඉරිදා පොළ ඉදිරිපිට අංක 02 දරන නවකඩ කාමරයේ ගිවිසුම 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වී ඇති අතර, වෙනත් පුද්ගලයකු විසින් අනවසරයෙන් භාවිතා කරනු ලබන බව නිරීක්ෂණය විය. මෙම කඩ කාමරයෙන් 2017 දෙසැම්බර් 31 දිනට රු.18,750 ක කඩ කුලී හා රු.125,000 ක එක්වන් මුදලක් හිඟව පැවතුණි.

(ඇ) බද්දේගම ප්‍රාදේශීය සභාව සතු නව ඉරිදා පොළ ඉදිරිපිට මාළු වෙළඳ කුටිය ධීවර සංස්ථාව විසින් 2003 වර්ෂයේ සිටම ගිවිසුම් ගතවීමෙන් තොරව පවත්වාගෙන යමින් තිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ 2014 නොවැම්බර් 27 මිලදී ගත් රු.383,000 ක් වටිනා ටයර් 11 ක් 2018 මාර්තු 02 දින වනවිටත් ගබඩාව තුළ නිශ්කාර්යව පැවතුණි.

(ii) 2017 මාර්තු 13 දින රු.45,520 ක වටිනාකමින් යුතු 650 **x** 16 ප්‍රමාණයේ ටයර් 06 ක් නැවත පුරවා තිබූ නමුත්, එම ටයර් භාවිතයට නොගෙන ගබඩාවේ නිෂ්කාර්යව තිබුණි.

(iii) කසළ කළමනාකරණ මධ්‍යස්ථාන භූමියේ කෘ කැබ් රථයක් හා ට්‍රැක්ටර් ට්‍රේලර් 03 ක් ද දිරාපත් වෙමින් පැවති අතර, 2016 වර්ෂයේ සිට ජේ.සී.බී. යන්ත්‍රයක් ද අක්‍රීයව පැවතුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

(අ) වියදම් විෂයයන් 08 ක එකතුව රු.16,987,861 ක් වූ ඉතිරිවීම් දක්නට ලැබුණ අතර, එම වටිනාකම් සියයට 01 සිට සියයට 70 අතර පරාසයක පැවතුණි.

(ආ) වියදම් විෂයයක අනුමත සීමාව ඉක්මවා රු.154,496 ක වියදම් දරා තිබුණු අතර, එම සීමා ඉක්මවීම සියයට 561 ක වටිනාකමක් ගෙන තිබුණි.

(ඇ) ආදායම් විෂයයන් 03 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.3,348,474 ක් වූ අතර, එම වටිනාකම් සියයට 06 සිට සියයට 471 අතර පරාසයක විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයෙන් ප්‍රාග්ධන වැය ලෙස වෙන්කල රු.2,500,500 කින් රු.1,060,377 ක් වැයකර නොතිබුණු අතර, සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම, ප්‍රමුඛතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම, සුභසාධන සේවා පහසුකම් ඇති කිරීම යන වැය විෂයයන් 04 කට වෙන්කර තිබුණු රු.8,150,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම උපයෝජන කර නොතිබූණෙන් අයවැය ලේඛනය මූල්‍ය පරිපාලනයේ ලා සාර්ථක මූල්‍ය පාලන ක්‍රමෝපායක් ලෙස ක්‍රියාත්මක වී නොතිබුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක : දපපා/යහ/01/නා.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව

ප්‍රමාණවත් පරිදි අභ්‍යන්තර විගණනයක් සිදුකර, එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද, සභාව විසින් අභ්‍යන්තර විගණක ලෙස ප්‍රධාන කළමනාකරණ සහකාර පත්කර තිබුණු අතර, එම නිළධාරිණියට සභාවේ වෙනත් කාර්යයන් ද පවරා තිබූ බැවින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමට නොහැකිව තිබුණි.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු

------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කලමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

--------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | | වත්කම් බැරකම් ශේෂයන් ද, ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂය ද යථා පරිදි නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | වත්කම් හා දේපල | (i) | ස්ථාවර වත්කම් ලේඛනයක් හා පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | | (ii) | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ වාර්ෂික සමීක්ෂණ පවත්වා නොතිබුණි. |
| (ඇ) | සේවක මණ්ඩල කළමනාකරණය | (i) | කාර්යය මණ්ඩල පුරප්පාඩු පුරවා නොගැනීම හා අතිරික්ත කාර්යය මණ්ඩලය විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (ii) | අයවිය යුතු ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (iii) | රාජකාරි පැවරීම් සිදුකර නොතිබීම හා තනතුරට අදාළ නොවන රාජකාරි පවරා තිබුණි. |
| (ඇ) | වාහන පාලනය | (i) | වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | | (ii) | නිෂ්ක්‍රීය වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | | (iii) | දෛනික ධාවන සටහන් සහ මාසික කාර්යසාධන සාරාංශ විගණනයට ඉදිරිපත් නොකෙරුණි. |
| (ඉ) | ආදායම් රැස්කිරීම | (i) | හිඟ ආදායම් අයකර නොතිබුණි. |
| | | (ii) | බැංකු ජංගම ගිණුම්වල පැවති අතිරික්ත මුදල් ආයෝජනය කර නොතිබුණි. |
| | | (iii) | අබලන්ව පැවති කඩ කාමර අළුත්වැඩියා කර, බදු දීමෙන් ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. |